**විවිධ කළමනාකරණ ස්ථරවල තොරතුරු පද්ධති**

සිය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ආයතන මගින් විවිධ වර්ගයේ තොරතුරු පද්ධති භාවිතා කරනු ලබයි. මෙලෙස ආයතන මගින් භාවිතා කරනු ලබන තොරතුරු පද්ධති සියල්ල පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැක.

- ……………………………………………
- ……………………………………………
- ……………………………………………
- ……………………………………………
- ……………………………………………
- ……………………………………………

මෙම තොරතුරු පද්ධති වලට අමතරව ව්‍යාපාරයක් විසින් සමහර සුවිශේෂී කාර්යයන් සිදුකිරීම සඳහා සුවිශේෂී තොරතුරු පද්ධති භාවිතා කරන අතර

- ……………………………………………
- ……………………………………………
- ……………………………………………

උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

**1. කාර්යාල ස්වයංක්‍රීයකරණ පද්ධති**

කාර්යාල ස්වයංක්‍රීයකරණය යනු යම් යම් කාර්යයන් සහ ව්‍යාපාරික ක්‍රියාවලිය සිදු කිරීම සඳහා විවිධ මෘදුකාංග සහ දෘඩාංග උපකරණ භාවිතයෙන් ව්‍යාපාරය පවත්නා තොරතුරු එක්රැස් කරන කළමනාකරණය කරන සහ ඒකාබද්ධ කරන ක්‍රියාදාමයයි. මෙම වර්ගයේ තොරතුරු පද්ධති කාර්යාලයේ කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා උපකාරී වේ. ඒවා තීරණ ගැනීම ආදිය සඳහා සීමිත හැකියාවක් පවතින අතර මෙහෙයුම් මට්ටමේ කටයුතු කිරීම සඳහා වැඩි වශයෙන් ප්‍රයෝජනවත් වෙයි. මෙවැනි පද්ධති මගින් ලබා ගන්නා තොරතුරු මෙහෙයුමට මෙම කළමනාකරුවන්ට රීති පාදක තීරණ ගැනීම් කටයුතු සඳහා භාවිත කිරීමේ හැකියාවක් ඇත. මෙම තොරතුරු පද්ධතිය මගින් කාර්යාල පරිසරයක් ස්වයංක්‍රීය කරනවා මෙන්ම කඩදාසි රහිත කාර්යාල පරිසරයක් ගොඩනැගීම සඳහා උපකාරී වේ. ඉතාමත් සරල ක්‍රියාවලින් පවා ස්වයංක්‍රීය කරණයට ලක් කරමින් කාර්යාලයීය ස්වයංක්‍රීයකරණ පද්ධති මගින් කාර්යාලයේ කාර්ය මන්ඩලයේ ඵලදායිතාවය වැඩි කිරීමට උපකාරී වේ. බොහෝ ව්‍යාපාර කාර්යාල සහිත පරිසරයක් ගොඩනැගීම සඳහා උත්සුක වනුයේ පහත සඳහන් වාසි සහගත තත්ත්වයන් ලබා ගැනීම සඳහා ය.

- පුනරාවර්තන කාර්යයන් සිදුකිරීම සඳහා හස්ත මැදිහත්වීම් නැතහොත් මානව මැදිහත්වීම් අවම කිරීම.
- මානව මැදිහත්වීම් අවම කිරීම.
- සැකසුම් කාලය අවම කිරීම.
- වඩාත් හොඳ කාර්යයන් දෘශ්‍යතාව සහ අවහිරතාව සඳහා ඇති විභවතාවයන් හඳුනාගැනීම .
- දත්ත පාදක කරගනිමින් වඩාත් හොඳ ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා ඉඩකඩ සැලසීම.
- කාර්යාලීය ක්‍රියාකාරකම් වඩාත් ඉක්මන් වීම සහ ඒවා ක්‍රියාවලිය මගින් බලගැන්වෙන ඒවා වීම.
- සියලු දත්ත ඩිජිටල් කරණය කිරීම සහ අනාගත පරිශීලනය සඳහා ඒවා කාර්යක්ෂමව ගබඩා කොට තැබීම.

කාර්යාලීය ස්වයංක්‍රීයකරණ පද්ධතිය සඳහා උදාහරණ ලෙස MS Office සමග ඇති මෘදුකාංග යෙදුම් පෙන්වා පෙන්වාදිය හැකිය. ඒවා මගින් කාර්යාලයක් ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා ඉදිරිපත් කිරීම් වදන් සැකසුම් සහ පැතුරුම්පත් දත්ත පදනම් ආදී පහසුකම් සපයා දෙයි.

**2. ගනුදෙනු සැකසුම් පද්ධති**

ගනුදෙනු සැකසුම් පද්ධතිය මගින් ව්‍යාපාරය සෑම මෙහෙයුමක් හරහා සිදුවන ගනුදෙනුවල ජනිත වූ දත්ත දර්ශනය කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම සහ සකස් කිරීම සිදුකරනු ලබයි. ගනුදෙනු සැකසුම් පද්ධතියක මූලික පරමාර්ථය වනුයේ ව්‍යාපාරයක් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරය කළමනාකරණය සහ ප්‍රතිපත්තීන් මගින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු සපයා දීමයි. ගනුදෙනු සැකසුම් පද්ධතියක පහත සඳහන් ලක්ෂණ හඳුනාගත හැකිය.

- ………………………………………………
- ………………………………………………
- ………………………………………………
- ………………………………………………
- ………………………………………………

ගනුදෙනු  සැකසුම් පද්ධති සඳහා උදාහරණ

- ……………………………………………………………………………
- ……………………………………………………………………………
- ……………………………………………………………………………
- ……………………………………………………………………………


ගනුදෙනු සැකසුම් පද්ධති ආයතනයෙන් විවිධ කාර්ය ක්ෂේත්‍රයන් තුළ ක්‍රියාත්මක වේ. විවිධ කාර්ය ක්ෂේත්‍රයන් සඳහා භාවිතා කරනු ලබන විවිධ ගනුදෙනු සැකසුම් පද්ධති සඳහා උදාහරණ පහත දැක්වේ.

| **කාර්යය ක්ෂේත්‍රය** | **ගනුදෙනු සැකසුම් පද්ධති** |
|---|---|
| ගිණුම්කරණ සහ මූල්‍ය | • ගිණුම් තොරතුරු පද්ධති<br>• මූල්‍ය තොරතුරු පද්ධති |
| අලෙවිකරණය සහ විකුණුම් | • විකුණුම් ස්ථාන පද්ධති<br>• විකුණුම් ඇණවුම් තොරතුරු පද්ධති |
| නිෂ්පාදන හා මෙහෙයුම් | • තොග පාලන පද්ධති<br>• තත්ත්ව පාලන පද්ධති<br>• යන්ත්‍ර පාලන පද්ධති |
| මානව සම්පත් කළමනාකරණය | • මානව සම්පත් තොරතුරු පද්ධති<br>• වැටුප් සැකසුම් පද්ධති<br>• කාර්ය මණ්ඩල ඇගයීම් පද්ධති |

ගනුදෙනු සැකසුම් පද්ධති වල තොරතුරු ප්‍රවාහයන්

සාමාන්‍ය ගනුදෙනු ගනුදෙනු සැකසුම් පද්ධතියක තොරතුරු ප්‍රවාහයන් පහත පරිදි විස්තර කර හැකිය.

1. අදාළ සිද්ධිය දත්ත ආදාන උපකරණ මගින් වාර්තා කරනු ලබයි.
2. ගනුදෙනු සැකසුම් පද්ධතිය මගින් දත්ත පදනම යාවත්කාලීන කරයි.
3. ගනුදෙනු සැකසුම් පද්ධතිය මගින් සාමාන්‍ය වාර්තා ජනනය කරයි.
4. පරිශීලකයන්හට ගනුදෙනු සැකසුම් පද්ධතිය වෙත විමසුම් ඉදිරිපත් කළ හැකිය.




ගනුදෙනු සැකසුම් පද්ධති වර්ග

- ..............................................................................
- ..............................................................................
- ..............................................................................


**තනිව පවතින පද්ධති.**

තනිව පවතින පද්ධතියක් සාමාන්‍යයෙන් තනි පරිශීලක පද්ධතියකි.  මෙවැනි වර්ගයේ පද්ධති සාමාන්‍යයෙන් කුඩා කාර්යාල පරිසරයක ක්‍රියාත්මක වන අතර ගනුදෙනු සැකසුම් පද්ධතියක දත්ත පදනමක් පුද්ගල පරිඝනකයක ගබඩා කොට තබයි. එම පද්ධතියෙහි විස්තර පහත දැක්වේ.




**ව්‍යවසාය සේවා සැපයුම් සේවා සේවාදායක පද්ධති.**

ව්‍යවසාය සේවා සැපයුම් සේවාදායක පද්ධති ව්‍යාපාරය පුරා ඇති සේවා සැපයුම් සහ සේවාදායක පරිගණක ජාලය හරහා එකිනෙකට සම්බන්ධ කොට ඇති පරිසරයක් තුළ ක්‍රියාත්මක වේ. මෙවැනි වර්ගයේ පද්ධති මගින් අපේක්ෂා කරනු ලබන දත්ත ගබඩා කොට ඇත්තේ කේන්ද්‍රීයව පිහිටුවා ඇති සේවා සැපයුම් පරිගණක තුළයි. ගනුදෙනු සැකසුම් පද්ධති සේවා සේවාදායක මෘදුකාංග පිහිටා ඇත්තේ පුද්ගල පරිඝනකයක වන අතර එමගින් කේන්ද්‍රීයව ගබඩා කොට ඇති දත්ත වලට ප්‍රවේශ වීමේ හැකියාවක් සකසා ඇත. මෙම වර්ගයේ තොරතුරු පද්ධති සාමාන්‍යයෙන් මධ්‍ය ප්‍රමාණයේ ආයතන තුළ ක්‍රියාත්මක වේ.



**වෙබ් පාදක ගනුදෙනු සැකසුම් පද්ධති**

පරිශීලකයාගේ පුද්ගල පරිගණකයේ පරිගණකයේ ස්ථාපනය කරනු නොලබයි ඒ වෙනුවට ගණුදෙනු සැකසුම් පද්ධතියට ප්‍රවේශ වීම සඳහා පරිශීලකයා වෙබ් පිරික්සුම් භාවිතා කරමින් අදාල වෙබ් ලිපිනයක් ඇතුළත් කරමින් ගණුදෙනු සැකසුම් පද්ධතියට ප්‍රවේශ විය යුතුය. මෙම පද්ධති වල ඉහළ පරිශීලකයන් ප්‍රමාණයක් සිටින අතර ඉහළ ප්‍රමාණයක් සහිත පරිගණක යන්ත්‍ර මෙම පද්ධති  සහ දත්ත පදනම් වල සත්කාරක සේවාවන් සඳහා භාවිත කරනු ලබයි .




කාණ්ඩ හෝ මාර්ගගත සැකසීම

ගනුදෙනු සැකසුම් පද්ධතියක් ප්‍රධාන ආකාර දෙකක සැකසුම් ක්‍රම භාවිතා කරයි

- කාණ්ඩ සැකසීම
- මාර්ගගත සැකසීම

කාණ්ඩ සැකසීමේදී ගනුදෙනුව හරහා එක් රැස් වන දත්ත කාණ්ඩ වලට වෙන් කරනු ලබයි. පද්ධතිය මගින් මෙම කාණ්ඩ කාලීනව සකස් කරනු ලබයි. උදාහරණයක් ලෙස පැයට වරක් මාර්ගගත සැකසීමේදී දත්ත කාණ්ඩ කිරීමකින් තොරව සකස් කරන අතර එය තත්කාලීන ව සිදු කිරීම අත්‍යවශ්‍ය නොවේ.




**කළමනාකරණ තොරතුරු පද්ධති**

ව්‍යාපාරයේ වර්තමාන කාර්ය සාධන තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා මධ්‍ය කළමනාකරණයේ උපායශීලී කළමනාකරුවන් විසින් කළමනාකරණ තොරතුරු පද්ධතිය භාවිතා කරනු ලබයි. ගනුදෙනු සැකසුම් පද්ධතිවල ප්‍රතිදානය කළමනාකරණ තොරතුරු පද්ධතියක ආදානය ලෙස භාවිතා කරනු ලබයි. කළමනාකරණ තොරතුරු පද්ධතියක් මෙම දත්ත සාමාන්‍ය රීති පද්ධතියක් ඔස්සේ සකස් කරනු ලබයි. දත්ත එක්රැස් කිරීම දත්ත රැස් කොට තොරතුරු නිර්මාණය කිරීම පසු භාවිතය සඳහා තොරතුරු වර්ගීකරණය සාරාංශගත කිරීම සහ වාර්තා උත්පාදනය සඳහා තොරතුරු බෙදා හැරීම ආදිය එලෙස සිදු කරනු ලබයි. මෙම තොරතුරු මධ්‍ය කළමනාකරණය මගින් භාවිත කරනු ලබන අතර ඒ හරහා කාර්ය සාධනයන් පරීක්ෂා කිරීම, නියාමනය කිරීම සහ පුරෝකථනය කිරීම සිදුකරනු ලබයි.

උදාහරණයක් ලෙස විද්‍යුත් ස්ථාන පද්ධතියේ හොඳින් ක්‍රියාත්මක වන නිෂ්පාදන සහ එලෙස ක්‍රියාත්මක නොවන නිෂ්පාදන මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැකිය. මෙම තොරතුරු ඉදිරි තොග ඇනවුම් කිරීම සඳහා භාවිතා කළ හැකිය. උදාහරණයක් ලෙස හොඳින් විකිණෙන ඇනවුම් වැඩි කිරීම සහ එලෙස නොවන නිෂ්පාදන ඇණවුම් කිරීම කිරීම අඩු කිරීම සිදු කළ හැකිය. කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා උදාහරණ ලෙස

- විකුණුම් කළමනාකරණ පද්ධති - මේවා විකුණුම් ස්ථාන පද්ධතිවලින් ආදාන ලබා ගනී.
- අයවැය පද්ධති - ආයතනයක් මගින් සිය කෙටි කාලීන සහ දිගු කාලීන ක්‍රියාවලීන් සඳහා කොපමණ මුදලක් වැය කොට තිබේ ද යන්න පෙන්වා දෙයි.
- මානව සම්පත් කලමනාකරණ පද්ධති - සේවකයන්ගේ සමස්ත අර්ථසාධන කළමනාකරණය කරනු ලබයි.

උපායශීලී කළමනාකරුවන් අර්ධ ව්‍යුහගත තීරණ ගැනීම සඳහා වගකීම් දරයි. කළමනාකරණ තොරතුරු පද්ධතියක් මගින් ව්‍යුහගත තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ද උත්පාදනය කරයි කළමනාකරුවාගේ පළපුරුද්ද අනුව ඔවුන් තීරණ ගනු ලබයි. උදාහරණයක් ලෙස දෙවන කාර්තුව සඳහා කොපමණ මිලදී ගැනීම් සිදු කළ යුතුද යන්න ප්‍රථම කාර්යය සලකා බැලීමේදී සිදු කළ හැකිය.

**කළමනාකරණ තොරතුරු පද්ධති වර්ග.**

කළමනාකරණ තොරතුරු පද්ධතිය යනු ඉතාමත් පුළුල් සංකල්පයකි . එහි ප්‍රධාන වර්ගයේ තවත් තොරතුරු පද්ධති කිහිපයක් අඩංගුව ඇත. පහත දැක්වෙනුයේ එවැනි පද්ධති කිහිපයකි.

- **අලෙවිකරණ තොරතුරු පද්ධතිය**

අලෙවිකරණ නිලධාරීන් මෙම පද්ධතිය භාවිතා කරමින් වර්තමාන සහ අතීත අලවිකරණ ව්‍යාපෘතීන් වල සාර්ථක අසාර්ථක බව අධ්‍යයනය කොට ඒ අනුව ඉදිරි අලෙවිකරණ සැකසුම් සකස් කිරීම සිදුකරනු ලබයි.

- **ව්‍යාපාර බුද්ධි පද්ධති**

එක්රැස් කරන ලද තොරතුරු විශ්ලේෂණය කරමින් ඒකාබද්ධ කරමින් සහ ඒකරාශී කරමින් ඒ මත පදනම්ව තීරණ ගැනීම සඳහා මෙම ව්‍යාපාර බුද්ධි පද්ධතිය භාවිතා කරනු ලබයි. මෙය විධායක තොරතුරු පද්ධති වලට සමාන වුවත් පහළ මට්ටමේ කළමනාකරුවන් විසින් ද භාවිතා කරනු ලබයි.

- **පාරිභෝගික සබඳතා සබඳතා කළමනාකරණ පද්ධති**

පාරිභෝගික සබඳතා පද්ධතියක් මගින් පාරිභෝගිකයන් අදාළ වැදගත් තොරතුරු ගබඩා කරනු ලබයි. ඒ අතර පෙර විකුණුම් සම්බන්ධතා තොරතුරු සහ විකුණුම් අවස්ථාවන් අන්තර්ගත වේ. අලෙවිකරණ පාරිභෝගික සේවා සහ ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් මෙම පද්ධති බහුලව භාවිතා කරනු ලබයි.

- **විකුණුම් බලකා ස්වයංක්‍රීයකරණ පද්ධතිය**

විකුණුම් ක්‍රියාවලිය සඳහා අදාළ යම් යම් කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම පාරිභෝගික කළමනාකරණ පද්ධතියක සුවිශේෂී අංගයකි. එහි සම්බන්ධතා කළමනාකරණය සහ ඇනවුම් කළමනාකරණය ආදී අංග ඇතුළත් වී තිබිය හැකිය.

- **දැනුම් කලමනාකරණ පද්ධති**

දැනුම් කළමනාකරණ පද්ධතියක් යනු ආයතනයකට තොරතුරු නිර්මාණය කිරීම, ග්‍රහණය කිරීම, ගබඩා කිරීම සහ ව්‍යාප්ත කිරීම සඳහා අදාල දැනුම කළමනාකරණය කරනු ලබන පද්ධති විශේෂයකි. දැනුම් කළමනාකරණ පද්ධතියක අරමුණ වනුයේ සේවකයින් ආයතනයේ තොරතුරු මූලාශ්‍ර සහ විසඳුම් කෙරෙහි ප්‍රවේශය සැලසීමයි.

- **මූල්‍ය ගිණුම්කරණ පද්ධති**

කළමණාකරණ තොරතුරු පද්ධතියක මෙම සුවිශේෂී පහසුකම මගින් ආයතනයන් මූල්‍ය සහ ගිණුම්කරණ කටයුතු හසුරුවනු ලබයි උදාහරණ ලෙස ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්.

- **මානව සම්පත් කළමණාකරණ පද්ධති**

මෙම තොරතුරු පද්ධතිය මගින් සේවකයන්ගේ කාර්ය සාධනය සහ වැටුප් සම්බන්ධ තොරතුරු පවත්වාගෙන යනු ලබයි.

- **සැපයුම් දාම කළමනාකරණ පද්ධතිය**

මෙම පද්ධතිය නිෂ්පාදන සමාගම් විසින් සම්පත් අමුද්‍රව්‍ය සහ සේවාවන් මිලදී ගැනීමේ සිට වෙළෙඳපොළ දක්වා වූ ප්‍රවාහයන් පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා භාවිතා කෙරේ.

**කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තා වර්ග**

කළමනාකරණ තොරතුරු පද්ධති මගින් දත්ත ගබඩා කිරීම සහ සාරාංශ කිරීම ආදිය සිදු සිදුකරමින් කළමනාකරුවන්ට විශ්ලේෂණය හා තීරණ ගැනීම සඳහා භාවිතා කළ හැකි වාර්තා උත්පාදනය කරයි. (මෙහිදී ආයතනයේ වර්තමාන කාර්ය සාධනය සහ ඓතිහාසික වාර්තා පදනම් කර ගනී) ප්‍රධාන වර්ග තුනක වාර්තා මෙම පද්ධතිය මගින් උත්පාදනය කරයි.

- **කාලීන / පෙළ ගස්වන ලද වාර්තා**

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

- **ව්‍යතිරේක වාර්තා**

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

- **සුවිශේෂී වාර්තා**

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................